Page 6 October 2012.qxd 24/10/2012 23:33 Page 1



# නිර්මාණ Nirmana

## සැනසුම

ලස්සන ගෙතුළ මනරංජන බඩු පුරවා
උස් පවුරකින් ගෙය සුරකින යුරු නිමවා
ගස් වැල් ගෙමිදුලේ මනරම් ලෙස සිටුවා
අස් වැසුමක් ලබති බොහොදෙන සිත පිනවා

අත්කර ගනු පිණිස සුව සහනය දිවි යේ
පත්වී විවා දිවියට තම යව්වන යේ
අත්වැල් බැඳන් ගෙවතත් කල් සිතු හැටි යේ
එක්වෙති ගැටළු විසඳන්නට නන් විදි යේ

දූ දරුවනගෙ මතු දියුණුව සලසන් න
රෑ දහවල් දෙකෙහි එක ලෙස වෙහෙසෙන් න
නෑ හිතවතුන් හට යුතුකම් නිමවන් න
මේ හැම දෙයම ගැන වෙයි සිත යොදවන් න

දහසක් පැතුම් පොදි බැඳගෙන හද මැදුරේ
මොහොතක් නැර දුවමින් ජීවිත කතරේ
හිඳැසක් නැතිව කරතත් වැඩ නිරන් තරේ
නොවැලැක්විය හැකියි එළඹෙන දුක් සසරේ

එබැවින් ලෝ දහම හොඳහැටි ඇඳින ගෙන
දුක සැප ළඟාවන විට නොසිතූ ලෙසින
පිළිගෙන සම සිතින් දවසැරියොත් යෙහෙන
සුනසුම ඔබට හමුවෙයි දිව රෑ සොයන

♦ ලන්ඩනයේ විසූ
අභාවප්‍රාප්ත විශ්‍රාමික විදුහල්පතිනි
ප්‍රේමා අදිකාරි

## බොඳවන සිහිනය

දියණිය සහ පුතණු දෙපසින් කර පින්නා
මගෙ පොඩි පුතා මා වෙත දුවගෙන එන්නා
මව් රට බලා විත් කාලය ගත වෙන්නා
නොහැකිව නලවන්න දරුවන් ලත වෙන්නා

හිමිදිරි උදේ දුව විත් පා යුග නැමදා
පාසැල බලා දිවයයි දරුවන් සැමදා
මග බල බලා හිටියත් එනතුරු පෙරදා
නැවතත් පන්ති ටියුෂන් යති දරු සැමදා

ශිෂ්‍යත්වයට එක දිනයක් වුනාවේ
දියණිට එදා නර්තනයකි සැඳැවේ
සිංහල ඉංග්‍රිසි පොත පත කලාවේ
සැමදා පන්ති කෙලෙසද දරු සිනාවේ

කුරුම්බැට්ටි මැෂිමක් දියණිට හැදුවේ
පොල්පිති ගොනා පුතුහට යයි මා සිතුවේ
එනමුදු නොමැත කාලය කෙළිදල හමුවේ
හදවත සුසුම්ලයි දරු දුක සිත ගැටුවේ

පොල් රුප්පාවෙ වෙරළේ වැලි තලාවේ
සෙල්ලම් කළ යුගය සිහිවන වෙලාවේ
මේ දරු දෙදෙන දුවනා සිප් කලාවේ
කෙළවර කෙසේ වේදැයි සිත මුලාවේ

නොදැනිම වේගයෙන් කාලය වියැ කෙනවා
ආපසු යන දිනය නොදැනිම ළං වෙනවා
සීයත් සමග දිනයක් අපෙ ගත වෙනවා
දරු දෙදෙනාගෙ සිහිනය දැන් බොඳ වෙනවා

♦ සුදර්ශණි ගුණවර්ධන Germany

## සඟවගත් ආදරය

හදවතින් දිවා රෑය නුඹේ මතකයෙ රැඳෙමි
සෙනෙහසින් නිබඳවම නුඹේ නාමය සොයමි
කඳුළකින් නෙතු තෙමන තුන් රෑයේ නුඹ සිඹිමි
ගිනිදැලින් මම් දැවෙමි නුඹේ මුදු සුව සොයමි !

♦ ධම්මි විජේසිංහ
Toronto Canada

## අද බැහැ හෙට !

ව ද විඳ රැකියාවෙහි මඳ අඩ සතකය කට
හොඳ කොටසක් වැටුපෙන් මම ගෙව්වෙමි රජ යට
ම ද වුව ඉන් ඉසුඹු වැටුප් ඇත මට ගන් නට
අ ද නැවිත් මෙහි මාරය මා වෙත එනු හෙට

මී විත් ගත් මිතුරන් හා විනෝද වෙන් නට
සාහිත් සම්මේලනයක මුලසුන ගන් නට
වා සිත් බැන දෙස්පාලන පොරට බසින් නට
නැවිත් මෙහි අද මාරය මා වෙත එනු හෙට

දරු වන් පිළිබඳ කටයුතු නැත එකලස් කොට
සරු කෙත් ගේ දොර පවරා නැත කිසි කෙනෙ කුට
හුරු නැත යන්නට යුතුකම් නොම අවසන් කොට
මරු වනි අද මෙහි නැවිත් මා වෙත එනු හෙට

රස විඳි එක මවකගෙ කිරි බව අමතක කොට
වස රක් අමනාප සිතින් සිටි සුළු වරදට
බස කින් මුදු බැරිවිය සොහොවුරු අමතන් නට
වස වත් මරු අද නැවිත් මා වෙත එනු හෙට

කාලය මිදිවිය දවසක් වත් සිල් ගන්නට
දා නය සහ අටපිරිකර සිතු ලෙස දෙන්නට
හීන ය ඇති මුත් බැරිවිය දඹදිව යන්නට
මාර ය අද මෙහි නැවිත් මා වෙත එනු හෙට

♦ වෛද්‍ය උපාලි අබේසිරි Middx UK



## විරහ ගීතයක සොඳුරුබව

කොතරම් සුමුදුද පියාපත්
ඉගිල යන සියොතුනගෙ
සිතෙයි මට
කොතරම් නිදහස්ද
උන්ගෙ ජීවිතය
කවුරුන් හෝ අල්ලා
සිරකරන තෙක්

කොතරම් සුන්දරද
සැළමුතු ආදරය
නපුරු මිනිසෙක්
ගල්ගසා උන් එකෙක්
බිම දමන තුරු

කොතරම් දුක්බරද
ගයනා විරහ ගීතය
හදවත පැලී මියෙන්නට
යන බව
දැනෙයි ඇසෙන විට

♦ වසන්තා කුමාරි
දසනායක
මයිලවලාන කිරිඳිවැල
Sri Lanka

## වස් කාලය උදාවෙයි

පැතිරෙයි ගම වටා අද සණ්ඨා සද්දේ
වට්ටිය පිරී ඇත නෙක මල් පිපි බැද්දේ
පන්සල් දුවති හවසට වැහි පොද මැද්දේ
පින් දම් කරති කවුරුත් වැඩපල මැද්දේ

පින්කම් කඨින හැම තැනකම පවතිනවා
සදහම් සුවඳ වා තලයට මුසු වෙනවා
බුදු බණපද අසා හදවත් සැනසෙනවා
වස් කාලයේ කවුරුත් පන්සල් යනවා

නැළවෙන අතර බෝපත් සිලි සිලි නදට
පැන් කලයකින් බෝධිය නැවෙයි යසට
බුදුගුණ ගායනා පැතිරෙයි දස අතට
යොමු වෙයි සිතට සසරින් එතෙරට යන්ට

සැරසෙයි කඨින පෙරහැර ගම වටා යන
මල් වැල් නැටුම් සේසත් කොඩි නගාගෙන
පිබිදෙයි මුළු ගමම බැතිමත් විලාසෙන
පිංකම කඨින සිරියාවකි උදාවෙන

♦ ප්‍රේමා සුරවීර රූපසිංහ
නුගේගොඩ Sri Lanka



## වරෙන් පුතේ මා බලන්න !

දිවිමග දියුණුවට ඇති සැලසුම් පාලා
දුර රටකට ගියා හනිකට පිය ඹාලා
මා ගැන සොයා බැලුවත් නිති විම සාලා
පාලුව පුතුනි! ඉන්නට බැ ඉව සාලා

එවූ තැගි පොදියක් අතටම ලැබුණා
කඳුලක ලුණු රසය මගෙ මුවගට දැනුණා
ඔබ දැක ගන්න හනිකට එන්නට සිතුණා
දුර බව මතක් වෙනවිට පපුවත් රිදුණා

හසරැල් කැළුම් නෑ මගෙ මුවගට එන්නේ
පලුව කාන්සිය හදවත ඉතිරෙන්නේ
දවසින් දවස නොදැනිම ඔහෙ ගත වෙන්නේ
කවදද පුතේ නුඹ ලංකාවට එන්නේ ?

කොතරම් දුකක් දැනුනත් එය වසා ගෙන
දෙවියන් යදිමි ඔබ දියුණුව පතා ගෙන
මොනවා නැතත් අම්මේ යයි කියා ගෙන
දවසක වරෙන් මම ඉන්නෙමි බලා ගෙන

♦ ශ්‍රීපාලි කොටුවැල්ල
Northridge, CA, USA

## කවි හිත

සුමුදු පෙණකැටි බිඳෙන වෙරළක
සුරත් රිවිරැස් වෙලුණ මොහොතක
නොකී කවියක ප්‍රථම පද පෙළ
නුඹ නොලීවා නම්
මගේ කවි හිත දවා රිදවන
කඳුළු නෑ එහෙනම් !

පැතුම් තරුකැට පිපුණු අහසක
මේඝයෙන් පිරි අඳුරු මොහොතක
තිමිර දියකළ සුසුදු ඡඳවත
නුඹම නොවුනා නම්
මගේ දරදඬු යොවුන් හිත යට
කඳුළු නෑ එහෙනම් !

සදා කාලික නොවූ ලෝකෙක
අකාලික පෙම් කතාවක් ගැන
මගේ කවිහිත මටම රහසේ
ගී නොලීවා නම්
බොළඳ හිරිමල් කවි හිතක් යට
කඳුළු නෑ එහෙනම් !

සොඳුරු අරණක නැවුම් සිහිනෙක
පැතුම් මල් පීදුණු ඉසව්වක
නැවුම් පදවැල් අතර නුඹ අද
සිනාසෙනවා නම්
මගේ කවි හිත දවා රිදවන
කඳුළු කුමටද දැන් ?

♦ කමනිකා මොහොට්ටිගේ
Cardiff Wales UK



## ඇත්ත නැත්ත

මන්දිරේ රසට රස රස බොජුන් ඉදෙන වා
ඒ සුවඳ ගේ පුරා දිවග ඉව කරන වා
කුස්සියේ වහලියගෙ නෙතග දුම් පිරෙන වා
පාට කළ රස බොජුන් දැකුම පිං තියෙන වා

මේසයක් සැරසෙන්නෙ මගෙ දිළිඳු අත් දෙකි න්
විවිධ වූ රසකැවිලි එකිනෙකට පරයමි න්
හිස්වෙනා බඳුන් දැක නොසැලෙනා හදවති න්
කුසගින්න නිවෙනවා ඉඳුල් බත් පිඩුවලි න්

මා පියන් සිහිව මගෙ නෙත කඳුළු පිරෙන වා
අම්මගේ රස බතක සුවඳ මට දැනෙන වා
පිය හිමිගෙ ආදරය සිහිව හද රිදෙන වා
මෙවන් දුක් මගෙ දුවට නොමවන්න පතන වා

දිළිඳුකම වැඩි නිසයි දුරු රටට ඉගිලු ණෝ
අනාගත ජීවිතය ජයගන්න සැරසු ණෝ
සුදු දුවගෙ සුදු මුහුණ බල බලයි සැනසු ණෝ
ඔබව යළි දුටු දිනයි මගේ දුක් නිමවු ණෝ!

♦ සුජීවා නාරම්මැද්ද Oman

## ජංගම තෙලබනුව

කවුද නුඹව හිරකළේ
ඇයිද පුරුදු හඬ නැතේ?
ඇඟිලි තුඩට මේ මගේ
අද පෙරසේ පණ නැතේ

සෙනෙහස දුර ගෙනගියේ
මේඝ දූතයන් නොවේ
මගෙ පණ නල අන් නොවේ
ජංගම තෙලබනුව වේ

වරෙක සොඳුරු පණිවුඩේ
ගෙන එන ක්‍රිං ක්‍රිං නදේ
කොවුලගෙ මිහිරිම ස්වරේ
මෙන් සවනෙහි නිති රැඳේ

මෙදින නිහඬ වුණු සඳේ
දැනේ පණ ද යන ලෙසේ
නැවත ගෙනෙනු හෙට දිනේ
ඇත එතෙර සිට තොසේ !

♦ ලක්ෂමී පෙරේරා
Carshalton, Surrey UK

## තරු

එක වරක් බැලූ පමණින්
නොපෙනෙන
සිහිති තාරකා කොපමණ
රෑඹරේ දිලෙනවාද

තිමිර සළු ඉරාගෙන එබෙන
සඳලිය තරම් නූනත්
දිලි දිලි නිවෙමින්
ඒ තරු මවන රටාවන්
සඳ තරම් ලස්සන නැද්ද?

සඳ පැහැදිලිය
බැලූ පමණින් දිස්වන
ලස්සනද උපරිමය

ඒත්
සඳ දිහා නොව
හොඳින් බැලුවොතින්
පමණක් පෙනෙන
පුංචිම පුංචි තරු දෙස බලා
සැනසෙන හිත්
කොච්චරක් නම් ඇත්ද?
පුදුමය නම්
ඒ සිහිති තරු පිපෙන්නෙත්
ඝන කළුවර අහසේ වීමයි

♦ එරංගා පෙරේරා
Netherlands

## අසිරිමත් මව් පියනි !

ලොව උතුම් පදවි ලද අසිරිමත් මව් පියනි
දරු මනස වැඩෙන්නේ ගසක් වැඩෙනා ලෙසිනි
දරුගත නොහැකි බර පැටෙව්වොත් නොනිසි යෙනි
ළපටි ගෙඩි ඉදවලා එහි රසය බලනු වැනි

දැනුම කුසලතා ආකල්ප තුළ වැඩෙන විට
දිය යුතුයි සෙනෙහසද දිරි වදන් හා සතුට
නොදුන්නොත් දඬුවමක් අයුතු දේ කරන විට
හැඳි නොගා හැදු හොද්ද වැනිය තම දරු එවිට

වැසි අවුත් මැටි පිඩක් ටිකෙන් ටික දියව යයි
කාලෙ කා දමන උන් මැටි පිඩට සමා නයි
වටහගෙන හැකියාව ඉගෙනීම දිය යුතුයි
එවිට දරු මැටි පිඩෙන් තැනු අනගි බඳුන වෙයි

තඹ ගුළිය වැටුණ හොත් ගං දියෙහි කිඳී යයි
රාග මළ පිරි සිතද තඹ ගුළිය සේ බරයි
බුදු දහම පුරුදු කළහොතින් සිත සැහැල් ලුයි
ජලය මත පාවෙනා පාත්තරයක් වැනියි

♦ ප්‍රදීපා වික්‍රමසිංහ
London SW19

## තාත්තාට...

පහනට තව තෙල් බිඳක්
දැසට එක සිනාවක්
දෝතටගෙන කඩුල්ල පැන
ඔබ එනවා සේ පෙනෙයි
සඳ අහසට නැවිදින්
තරු විමනම පාළුවෙන්
අමාවකම අහස බිඳගෙන
ඔබ එනවා නම් හිතෙයි
මහ පොළවට බර වැඩියි
අපේ නෙතග කඳුලැලී
වැටෙන්නට නොදී පිසින්න
ඔබ එනවා නම් යළී
අසන්නට අපේ කතා
දකින්නට නැතිව සිනා
දැනී තනිකමයි දුකයි
ඔබ එනවා සහතිකයි !

♦ වත්සලා ඉරෝෂිනී
කරුණාරත්න
*Sri Lanka*

## ඔබෙන් පසු......!

දේදුන්නක් ලෙසින් පාය මගෙ ලොවට
සිත සැනසුවා ඔබ මා කෙටි කාලෙකට
නෙත් හැර බලන විට නිල්වන් අහස දෙස
මැකී ගොසින් ඔබ දේදුන්නක් ලෙසට
ඔබ බැඳුනත් මා වෙත මගෙ හැඩරුවට
මා බැඳුණේ ඔබ වෙත ඔබගේ සිතට
එතැනයි වෙනස මා පවසන්නේ ඔබට
දෙදෙනා අතර ඇති සෙනෙහස එකිනෙකට
කාලය කෙටි වුනත් සෙනෙහස නිමක් නැත
ජීවය හැර ගියා වැනි ගිනි තබා සිත
විහිදා පියාපත් ඔබ ඉගිල යනවිට
බලා සිටිමි තටු නැති කුරවියක ලෙස


♦ කරුණා ජයමහ Sri Lanka

## සිර දඬුවම

නැසියන් වැලපුණි එදා
තීන්දුව පැවසෙද්දි
විනිසුරුගෙ මුවින්
සිරගෙදරට මා යැවෙන

සිට පියවි සිහියෙන්
කළ වැරදි වෙනුවෙන්
දහ ගෙයි දැමීමේ
අයුත්තක් නොදුටිමි

මා පමණි දැන් හඬන්නේ
නැසියන්ගේ තීන්දුව
වැකෙන කල සවනට
මහලු මඩමට මා යැවෙන



සිහිමදකමින්
මා නොසිතා කරන දේවල්
වැරදි වෙද නුඹලට
අයුතු තීරණ ගන්න ?

♦ සුනිල් පෙරේරා
Skegness Lincs UK